# ධීවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

## ලංකා ධීවර සංස්ථාව

## පුරප්පාඩු

ලංකා ධීවර සංස්ථාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සේවා ගණය : ජ්‍යෙෂ්ඨ කළමනාකාර**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) (HM 1-1)**

**සුදුසුකම්**
**බාහිර අපේක්ෂකයින්**

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අලෙවි/වාණිජ/ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබිම.

සමග

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අලෙවි/වාණිජ/ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබිම

සහ

රාජ්‍ය ආයතනයක/ සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක/ පිළිගත් වාණිජ ආයතනයක අලෙවි කටයුතු පිළිබඳව කලමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

සටහන : ක්ෂේත්‍රයට අදාළ පොත්- පත් පළකර තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අභ්‍යන්තර අපේක්ෂිකයින් - (පහත 1 හෝ 2)**

01. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා වන සුදුසුකම් ලබා තිබිම.
02. කළමනාකාර සේවා ගණයෙහි (එම්. එම් 1-1) තනතුරක , 1 වන ශ්‍රේණියේ අලෙවි කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සටහන : ක්ෂේත්‍රයට අදාළ පොත්- පත් පළකර තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

වැටුප : **HM 1-1- 2025 Rs. [140,640 – 15x4,100 -202,140]**
**රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් දීමනා (ජීවන වියදම් දීමනාව) හිමි වේ.**

**වෙනත් ප්‍රතිලාභ :**

1. සේවක අර්ථ සාධක අරමුදල් වෙනුවෙන් වැටුපෙන් අඩුකර ගන්නා 10% දායක මුදල සඳහා සංස්ථාව මගින් 15% දායක මුදලක් බැර කරනු ලැබේ.
2. සේවක භාරකාර අරමුදල සඳහා සංස්ථාව 3%ක ප්‍රදානයන් බැර කරනු ලැබේ.
3. රජයේ චක්‍රලේඛ අනුව ප්‍රවාහන පහසුකම් / හෝ දීමනා.

**පොදු කොන්දේසි**

(අ) අපේක්ෂකයින්ගේ වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි අයවිය යුතු වේ.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

(ආ)රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ඈ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු වේ.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත තොරතුරු (CV) හා අදාල අධ්‍යාපන සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සහිතව **2026 .06.07** දිනට හෝ ඊට ප්‍රථම තනතුරේ නම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (E mail : chairman@cfc.gov.lk)

සභාපති
ලංකා ධීවර සංස්ථාව
නො 15, රොක් හවුස් පටුමග
කොළඹ 15.
දුරකථන අංක 0112-540455